03

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 14 දරන විශ්‍රාම වැටුප් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 මැයි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 මැයි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 30 යි.    තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1988 අංක 14 දරන විශ්‍රාම වැටුප් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 මැයි මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 32/87

**1985 අංක 30 දරන විශ්‍රාම වැටුප් (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 14 දරන විශ්‍රාම වැටුප් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. 1985 අංක 30 දරන විශ්‍රාම වැටුප් (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ " (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ, (358 වන අධිකාරය වූ) නාවුක හමුදා පනතේ, (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ, ඒවා යටතේ සාදන ලද නියෝගවල හෝ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ ", යන වචන හා ඉලක්කම් වෙනුවට " (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ, (358 වන අධිකාරය වූ) නාවුක හමුදා පනතේ, (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ, (432 වන අධිකාරය වූ) පාඨශාලාචාර්ය වරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ, 1957 අංක 61 දරන විදේශ විදුලි සංදේශ පනතේ, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ, ඒවා යටතේ සාදන ලද නියෝගවල හෝ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ ", යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. **1985 අංක 30 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

ඊ—101442—7,910 (88/02)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා, පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.